සියලු ම හිමිකම් ඇවිරිණි ]
முழுப் பதிப்புரிமையுடையது ]
All Rights Reserved]

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව - කොළඹ අධ්‍යාපන කලාපය
Western Provincial Education Department - Colombo Educational Zone

දෙවන වාර ඇගයීම - 2016
இரண்டாம் தவணைப்பரீட்சை - 2016
Second Term Evaluation - 2016

6 ශ්‍රේණිය
தரம் 6
Grade 6

බුද්ධ ධර්මය I,II පත්‍ර
புத்த சமயம் வினாத்தாள்-I-II
Buddhism I,II Paper

පැය දෙකයි
இரண்டு மணித்தியாலங்கள்
Two Hours

## I කොටස

- I කොටසේ ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සපයන්න.
- දී ඇති පිළිතුරු අතරින් වඩාත් ම නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.
- I කොටසට ලකුණු 40 කි.

01. සිද්ධාර්ථ කුමරු කුඩා කල ශිල්ප උගත්තේ කාගෙන් ද?
    i. අසිත තවුසාගෙනි
    ii. සර්ව මිත්‍ර බමුණාගෙනි
    iii. භග්ගව තවුසාගෙනි
    iv. උද්දකරාමපුත්ත තවුසාගෙනි

02. සිද්ධාර්ථ කුමරු මහාභිනිෂ්ක්‍රමණය කළේ,
    i. වෙසක් පොහොය දිනයක දී ය.
    ii. පොසොන් පොහොය දිනයක දී ය.
    iii. ඇසළ පොහොය දිනයක දී ය.
    iv. වප් පොහොය දිනයක දී ය.

03. "බුදුබව ලබා පළමුව මගේ රාජ්‍යයට වඩින්නැ " යි ඉල්ලා සිටියේ,
    i. ශුද්ධෝදන රජුය.
    ii. බිම්බිසාර රජුය.
    iii. බරණැස් රජුය.
    iv. අජාසත් රජුය.

04. සිද්ධාර්ථ තවුසාණන් හට කුස තණ මිටි අටක් පූජා කළේ,
    i. කොණ්ඩඤ්ඤ බමුණා ය.
    ii. අසිත තවුසා ය.
    iii. සොත්ථිය බමුණා ය.
    iv. ආලාර කාලාම තවුසා ය.

05. පුද්ගලයකුගේ දියුණුවීම සඳහා බලපාන ප්‍රධාන කරුණු හයක් ගැන හොඳින් පැහැදිලි කරදෙන ජාතක කතාවක් වන්නේ,
    i. අත්ථස්සද්වාර ජාතකය යි.
    ii. මඝමානවක ජාතකය යි.
    iii. සේරිවානිජ ජාතකය යි.
    iv. කුස ජාතකය යි.

06. බුදු දහමේ දැක්වෙන රන් දොරටු නැතහොත් පුද්ගලයකුගේ දියුණුවට බලපාන ප්‍රධාන කරුණුවලට අයත් **නොවන්නේ** පහත දැක්වෙන කවර කරුණක් ද?
    i. නිරෝගී බව
    ii. ආඩම්බරකම
    iii. සිල්වත් බව
    iv. අලස නොවීම



57

07. ශීල,සමාධි,ප්‍රඥා යන අංග තුන හඳුන්වන්නේ,

i. ත්‍රී ශික්ෂා ලෙස ය.
ii. තිදොර ලෙස ය.
iii. ත්‍රී ලක්ෂණ ලෙස ය.
iv. ත්‍රිවිද්‍යා ලෙස ය.

08. යහපත් ක්‍රියාවන් නැතහොත් සම්මා කම්මන්තය ගැන කියවෙන නිවැරදි පිළිතුර වන්නේ,

i. සතුන් මැරීමෙන් වැළකීම,බොරු කීමෙන් වැළකීම හා කාමයෙහි වරදවා හැසිරීමෙන් වැළකීම ය.
ii. සතුන් මැරීමෙන් වැළකීම,සොරකමෙන් වැළකීම හා කාමයෙහි වරදවා හැසිරීමෙන් වැළකීම ය.
iii. බොරු කීමෙන් වැළකීම, සතුන් මැරීමෙන් වැළකීම හා සොරකමෙන් වැළකීම ය.
iv. බොරු කීමෙන් වැළකීම,හිස්වචනයෙන් වැළකීම හා පරුෂ වචනයෙන් වැළකීම ය.

09. නුදුන් දෙයක් සොර සිතකින් නොගන්නෙමි
අනුන් ලවා සොරකම් නොකර වන්නෙමි
හොරෙන් ගැනුම අනුමත නොම කරන්නෙමි
ලැබෙන්නකින් සතුටුව දිවි ගෙවන්නෙමි

ඉහත කවියෙන් දැක්වෙන සිල්පදය කුමක් ද?

i. පාණාතිපාතා වේරමණී සික්ඛාපදං සමාදියාමි.
ii. අදින්නාදානා වේරමණී සික්ඛාපදං සමාදියාමි.
iii. කාමේසු මිච්ඡාචාරා වේරමණී සික්ඛාපදං සමාදියාමි.
iv. මුසාවාදා වේරමණී සික්ඛාපදං සමාදියාමි.

10. දෙමාපියන්ගෙන් දරුවන්ට මෙන්ම දරුවන්ගෙන් දෙමාපියන්ට ඉටුවිය යුතු යුතුකම් හා වගකීම් ගැන බුදුරජාණන් වහන්සේ දේශනා කළ සූත්‍රය වන්නේ,

i. කරණීය මෙත්ත සූත්‍රය යි.
ii. සිගාලෝවාද සූත්‍රය යි.
iii. රතන සූත්‍රය යි.
iv. මංගල සූත්‍රය යි.

11. අමාලි ඕනෑම දෙයකදී මැදහත් ව සිතා කටයුතු කරන කෙනෙකි. ඇය සතුවන්නේ පහත සඳහන් කුමන ගුණාංගය ද?

i. මෙත්තා
ii. කරුණා
iii. මුදිතා
iv. උපේක්ඛා

12. ශ්‍රී ලාංකික ජාතික කොඩියේ කහ පාට තීරුවෙන් දැක්වෙන්නේ කුමක් ද ?

i. විනය ගරුක හා නිර්භීත කම
ii. සතර බඹ විහරණ
iii. විවිධ ජාතීන්
iv. සියලු ජාතීන් අතර එකමුතුව හා එකිනෙකා අතර අවබෝධය

13. තමා වැරදි කිරීමෙන් වැළකීම, අනුන් ලවා වැරදි නොකරවීම , අනුන්ට වැරදි කිරීමට අනුබල නොදීම යන කරුණු බුදු දහමේ හඳුන්වන්නේ,

i. අකුසල ක්‍රියා නමිනි.
ii. ත්‍රිකෝටික පාරිශුද්ධ ශීලය නමිනි.
iii. කුසල ක්‍රියා නමිනි.
iv. විරමණය හා සමාදානය නමිනි.

14. අපේ ජාතික ගීය නිර්මාණය කරන ලද්දේ,

i. මහගම සේකර මහතා විසිනි.
ii. ~~ආනන්ද සමරකෝන් මහතා විසිනි.~~
iii. ආනන්ද රාජකරුණා මහතා විසිනි.
iv. ~~සුනිල් ආරියරත්න මහතා විසිනි.~~

15. දෙමාපියන් සමාන කර ඇත්තේ,

i. නැගෙනහිර දිසාවටය.
ii. බටහිර දිසාවටය.
iii. උතුරු දිසාවටය.
iv. දකුණු දිසාවටය.

16. ආනිසංස එකොළහක් ලබාගත හැකි සියලු දෙනාට ම හිතවත්කම පතුරුවා හැරීමේ භාවනාව නම්,

i. බුද්ධානුස්සති භාවනාව ය.
ii. ආනාපාන සති භාවනාව ය.
iii. ධම්මානුස්සති භාවනාව ය.
iv. මෛත්‍රී භාවනාව ය.

17. ලෝකයේ ඇති සියලු ජීව අජීව වස්තූන්ට පොදු කරුණක් වන්නේ පහත දැක්වෙන කවරක් ද?

i. ඒකකාරීව පැවතීම.
ii. වෙනස් වීම.
iii. වෙනස් නොවීම.
iv. දිනෙන් දින වර්ධනය වීම.

18. " ආනන්ද සර්පයා දුටුවා ද ?" යනුවෙන් බුදුරජාණන් වහන්සේ ආනන්ද හිමියන්ගෙන් ඇසූ ප්‍රශ්නයේ සර්පයා යනුවෙන් අදහස් කළේ,

i. විසකුරු සර්පයෙකි.
ii. මුදල් පසුම්බියකි.
iii. සොරෙකි.
iv. පුද්ගලයෙකි.

19. හොඳ, නරක වෙන්කර හඳුනාගැනීමට බුදුරජාණන් වහන්සේ,රාහුල හිමියන්ට දේශනා කළ සූත්‍රය වන්නේ,

i. චූල්ල රාහුලෝවාද සූත්‍රය යි.
ii. දම්සක් පැවතුම් සූත්‍රය යි.
iii. අම්බලට්ඨික රාහුලෝවාද සූත්‍රය යි.
iv. අනත්ත ලක්ඛණ සූත්‍රය යි.

20. ලෝකයේ ඇති සියලු දේ වෙනස්වන බව වටහා ගැනීමෙන් ලැබෙන ප්‍රයෝජනයක් වන්නේ,

i. ලද දෙයින් සතුටු විය හැකි වීමය.
ii. මුදල් ලබාගත හැකි වීමය.
iii. තෑගි ලබාගත හැකි වීමය.
iv. දේපල උරුම වීමය.



59

## II කොටස

- පළමු ප්‍රශ්නය අනිවාර්ය වේ.
- පළමු ප්‍රශ්නයට හා තවත් ප්‍රශ්න හතරකට පිළිතුරු සපයන්න.
- පළමු ප්‍රශ්නයට ලකුණු 20 යි. අනෙක් ප්‍රශ්න වලට ලකුණු 10 බැගින් මුළු ලකුණු 60 කි.

01. දෙවන වාරයේ පැවති පොහෝ දින මුල් කරගෙන ඔබේ පාසලේ හා පන්තියේ සිදු කළ ක්‍රියාකාරකම් ඇසුරින් පහත ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

i. දෙවන වාරයේදී පසු වූ පොහොය දින දෙකක් නම් කරන්න. (ලකුණු 02)
ii. එම පොහොය දෙක වැදගත්වීමට හේතු මොනවාදැයි වෙන වෙන ම ලියන්න. (ලකුණු 04)
iii. ඉන් එක් පොහොයක දී ඔබේ පාසලේ / ඔබේ පන්තියේ කළ විශේෂ ක්‍රියාකාරකම් 04 ක් ලියා දක්වන්න. (ලකුණු 04)
iv. එම ක්‍රියාකාරකම් තුළින් ඔබ ලබාගත් අත්දැකීම් දෙකක් ලියන්න. (ලකුණු 04)
v. ඔබේ පාසලේ / ඔබේ පන්තියේ සිදු කළ එම ක්‍රියාකාරකම්වල නිරතවීමේ දී ඔබට මතුවූ ගැටලුවක් ලියන්න. (ලකුණු 0[illegible])
vi. බොදු දරුවෙක් ලෙස එම ගැටලුව නිරාකරණය කිරීමට ඔබට කළ හැකි දේ විස්තර කරන්න. (ලකුණු 02)
vii. දෙවන වාරයේ පසුවූ එක් පොහොයක් ලාංකිකයන්ට ඉතාමත් වැදගත් වේ. එම පොහොය නම් කරන්න. (ලකුණු 02)

02. i. ශීල ශික්ෂාවට අයත් අංග තුනෙන් දෙකක් නම් කරන්න. (ලකුණු 02)
ii. කයෙන් සිදුවන අකුසල් තුනක් ලියන්න. (ලකුණු 03)
iii. සිල්වත්ව කටයුතු කිරීමෙන් ලබාගත හැකි ආනිසංස ගැන විස්තර කරන්න. (ලකුණු 05)

03. i. පුද්ගල ජිවිතයේ විවිධ අවධි නම් කරන්න. (ලකුණු 02)
ii. අනිත්‍යතාව යනුවෙන් බුදු දහමේ හඳුන්වන්නේ කුමක් දැයි පහදන්න. (ලකුණු 03)
iii. වෙනස්වීමේ ධර්මතාවට නොසැලී මුහුණ දීම සඳහා ඔබට කළ හැකි දේ ලියන්න. (ලකුණු 05)

04. i. දෙමාපියන් බ්‍රහ්ම යන නමින් හඳුන්වන්නේ ඇයි ? (ලකුණු 02)
ii. දෙමාපියන් සතුටින් තැබීමට ඔබට කළ හැකි කාර්යයන් 03 ක් ලියන්න. (ලකුණු 03)
iii. බුදුරජාණන් වහන්සේ දේශනා කළ ආකාරයට දෙමාපියන් විසින් දරුවන්ට ඉටු කළ යුතු යුතුකම් පහ ලියන්න. (ලකුණු 0

05. i. මඝ මානවක කතාවෙන් ඔබට ලබා ගත හැකි ආදර්ශ දෙකක් ලියන්න. (ලකුණු 02)
ii. මඝ මානවකයා ඇතුළු තරුණ පිරිස ආරක්ෂා කළ ප්‍රතිපත්ති හතකි. ඉන් තුනක් ලියන්න. (ලකුණු 03)
iii. පාසල් යන ශිෂ්‍යයන් වශයෙන් එකමුතු ව වැඩ කිරීමෙන් ඇතිවන යහපත කවරේදැයි විස්තර කරන්න. (ලකුණු 05)

06. i. අපේ ජාතික කොඩියේ ඇති සංකේත දෙකක් නම් කරන්න. (ලකුණු 02)
ii. ජාතික කොඩිය පරිහරණය කිරීමේ දී සැලකිලිමත් විය යුතු කරුණු තුනක් ලියන්න. (ලකුණු 03)
iii. සුවඳ මලින් පිරුණු නා ගස ගැන වාක්‍ය පහක් ලියන්න. (ලකුණු 05)

07. i. රාහුල හිමියන් රහත් වූයේ කුමන සූත්‍රය ඇසීමෙන් පසුව ද ? (ලකුණු 02)
ii. රාහුල හිමියන් උදෙන් ම නැගිට වැලි දෝතක් උඩ දමා කළ ප්‍රාර්ථනාව කුමක් ද ? (ලකුණු 03)
iii. රාහුල හිමියන්ගේ චරිතයෙන් ඔබේ ජීවිතයට ලබා ගත හැකි ආදර්ශ පහක් ලියන්න. (ලකුණු 05)